# දෙවන වාර පරීක්ෂණය - 2016

| 08 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව | කාලය පැය 02 යි. |
|---|---|---|

14-07-2016

නම:-............................................. පංතිය:-........... අංකය:-........

REFERENCE ONLY

උපදෙස්:

- 1 හා 2 යන කොටස් වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- 1 කොටසේ සියලුම ප්‍රශ්න වලට සහ 2 කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.
- 1 හා 2 ප්‍රශ්න පත්‍ර සඳහා මුළු ලකුණු 50ක් වන අතර, ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50ක් වශයෙන් මුළු ලකුණු 100කි.

## 01 කොටස

- ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. අලුතින් යමක් සිතීම සහ මවාගැනීම

1. අනුකරණයයි 2. පරිකල්පනයයි 3. සමාරෝපයයි 4. අනුරූපණයයි

02. චරිත අතර ප්‍රතිවිරුද්ධ අදහස් මතුවීමෙන් නිර්මාණය වන්නේ

1. ගැටුම් අවස්ථාය 2. විවිධ අද්දැකීම්ය 3. කතා වස්තුය 4. සාහිත්‍ය නිර්මාණයන්ය

03. සෙල්ලං ලෙල්ලං නාට්‍යයේ ළමුන් විසින් කරන ක්‍රීඩාවකි

1. මේවර කෙළිය 2. වැට බිඳින සෙල්ලම 3. එළුවන් කෑම 4. ඔළිඳ කෙළිය

04. රූකඩ නාට්‍යවල දක්නට ලැබෙන සංගීත භාණ්ඩයක් නොවන්නේ

1. සර්පිනාව 2. සිතාරය 3. ඩොල්කිය 4. තබ්ලාව

05. මනාව ගලපන ලද කතා වස්තුවක් නිර්මාණය කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන්නේ

1. චරිත නිරූපණයයි 2. අත්දැකීමයි 3. පුහුණුවයි 4. තේමාවයි

- ප්‍රශ්ණ අංක 06 - 10 දක්වා ප්‍රශ්ණ සඳහා A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.

| | |
|---|---|
| 06. මාෂා සහ වළහා | දික්තල කාලගෝල |
| 07. යහපත් සමරිතානුවරයා | රූකඩ |
| 08. කන්ද්‍රරූ ලී / අම්බලන්ගොඩ | ඩී. කුමාරගේ |
| 09. සංවාද භාවිතා නොකිරීම | අභිරූපණ |
| 10. '' ආලේ බැන්ද මාගේ රම්‍ය වන් '' | බයිබල් උපමා කතා |

- **ප්‍රශ්ණ අංක 11 සිට 15 දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් ( ✓ ) ලකුණද , වැරදි නම් ( ✕ ) ලකුණද යොදන්න.**

11. සමාජය තුළ සාරධර්ම ගොඩනැගීම සඳහා ආගමික තේමාවක් රැගත් නාට්‍ය ප්‍රබල මෙහෙයක් ඉටු කරයි. (    )

12. රූකඩ සඳහා සංකීර්ණ පසුතල යොදා ගත යුතුය. (    )

13. සෙල්ලං ලෙල්ලං නාට්‍යය නිර්මාණය කරන ලද්දේ, අමිතා රබ්බිඩිගල මහත්මියයි. (    )

14. නාට්‍ය ගීත රඟපාමින් ගායනා කල නොහැක. (    )

15. නාට්‍යයක් රසවිඳීමේදී කතා වස්තුව ප්‍රධාන නොවේ. (    )

- **ප්‍රශ්ණ අංක 16 සිට 20 දක්වා දී ඇත ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

( ආහාර්ය අභිනය, කටහඬ අභ්‍යාස, වෙස්සන්තර, අත්රූකඩ සහ ඇඟිලි රූකඩ, විදුර, රංග අභ්‍යාස, සෙල්ලං ලෙල්ලං, නාට්‍යෝචිත අවස්ථාව, රිටි රූකඩ සහ කෝප්ප රූකඩ, පුංචි අපට දැන් තේරේ. )

16. "දම් වැසි වස්සන ලෝකේ " යන ගීතය ........................... නූර්තියේ විමලා දේවිය ගායනා කරන ගීතයකි.

17. රංගනයේදී ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවය ඇති කර ගැනීම සඳහා........................ ........................භාවිතා කළ හැකිය.

18. ළමයින්ට අධ්‍යාපන කටයුතු කෙළි සෙල්ලම් මෙන්ම ගෙදර දොරේ වගකිව යුතු යුතුකම්ද පැවරී ඇති බව ........................................................ නාට්‍යයෙන් ප්‍රකට වේ.

19. කතාන්දරයක් නාට්‍යයක් බවට පත් කිරීමේදී කථාවේ දැක්වෙන .................................. හඳුනා ගත යුතුය.

20. පහත දැක්වෙන රූකඩ පිළිවෙළින් ..................................................................... වේ.





## 02 කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන සංවාද කණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A "මට කැලේ ඇවිදලා මහන්සියි. මම ටිකක් හාන්සිවෙලා අලස සුවයෙන් අහගෙන ඉන්නම්............. කියන්නකෝ."

B "රොන් මැස්සෝ රොන් ගෙනෙති
මුර මැස්සෝ මුර කරති
සෙසු මැස්සෝ වද හදති
එකමුතු වී වැඩ කරති"

1. මෙම සංවාද ඛණ්ඩය ඉදිරිපත් කරන A සහ B චරිත දෙක නම් කරන්න.
2. ඉහත සංවාද ඛණ්ඩය අයත් නාට්‍යය සහ එහි රචකයා නම් කරන්න.
3. ඉහත සංවාදයේ පද්‍ය කොටසින් දැක්වෙන, ඔබට ආදර්ශයක් ගත හැකි, මැස්සන් සිදු කරන යහපත් ක්‍රියාව කුමක්ද?
4. මෙම නාට්‍යයේ කතා නායිකාව කැලයේ අතරමංවීමට හේතුව කුමක්ද?
5. මෙම නාට්‍යයෙන් ඔබට සංනිවේදනය කරනු ලබන පණිවිඩ 02 ක් ලියන්න.

02. 1. ඔබ දන්නා රංග අභ්‍යාස වර්ග 02 ක් ලියන්න.

2. රංග ක්‍රීඩාවල යෙදීමෙන් නළුවෙකුට ඇති ප්‍රයෝජන 02 ක් ලියන්න.

3. ශරීරය සැහැල්ලු කිරීම සඳහා භාවිතා කරන රංග අභ්‍යාස 02 ක් නම් කර, එය සිදු කරන අයුරු ඔබේ වචනයෙන් ලියන්න.

03. 1. ක්‍රියාකරවීම අනුව වර්ග වන රූකඩ වර්ග 02 ක් නම් කරන්න.

2. රූකඩ නාට්‍ය සංගීතය සඳහා භාවිතා කරන භාණ්ඩ 02 ක් නම් කරන්න.

3. රූකඩ නාට්‍යයක් සකස් කර ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් කෙටියෙන් විස්තර කරන්න.

04. 1. ළමා නාට්‍ය 03 ක් නම් කරන්න.

2. ළමා නාට්‍යයක තිබිය යුතු ලක්ෂණ 02 ක් ලියන්න.

3. ළමා නාට්‍යයක් නැරඹීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන 05 ක් ලියන්න.

05. 1. සෙල්ලං ලෙල්ලං ළමා නාට්‍යය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද?

2. ළමුන් තුළ පවතින විවිධ යහගුණ ඉස්මතු වූ අවස්ථා 02 ක් සෙල්ලං ලෙල්ලං ළමා නාට්‍යයය ඇසුරෙන් පෙන්වා දෙන්න.

3. කුඩා දරුවෙකු වශයෙන්, ඔබ විසින් නිවසේදී ඉටුකල යුතු යුතුකම් 04 ක් ලියා දක්වන්න.